නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතිය - 2020
-----------------------------------------------------

නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එළඹි අංක 3706 එස්ආර්අයි (සීඔඑල්) දරන ණය පහසුකම් ගිවිසුමේ 4.02 (ඒ) වගන්තිය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම අනුව, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර උපාය මාර්ගික නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ප්‍රමුඛ නාගරික සංවර්ධන ව්‍යාපෘතිවල ඉහල මට්ටමේ සූදානමක් ඇති කිරීමයි. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 1,090.98 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 5.74 ක් වන අතර ඉන් රු. මිලියන 883.88 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 4.65 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 මාර්තු 06 දින ආරම්භ කරන ලද අතර 2021 සැප්තැම්බර් 30 දින වන විට නිමකිරිමට නියමිතය.

## 1.3 මතය

ව්‍යාපෘතියෙහි 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනම සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළිවෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් පිළිබඳව නිසි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑමට නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද මුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බවට අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** භෞතික කාර්යසාධනය

**2.1** ව්‍යාපෘතියේ වැඩකටයුතුවල භෞතික කාර්යසාධනය

| සංරචකය | කාර්යය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| තිරසාර නාගරික යටිතල පහසුකම් හඳුනා ගැනීම | සැලසුම් කිරීම, විස්තරාත්මක නිර්මාණකරණය සහ ප්‍රසම්පාදන, ප්‍රවාහන මාර්ග තදබදය, නාගරික සංවර්ධන උසස් කිරීම්, පරිසර කළමනාකරණ සේවාවන් සඳහා වූ උපදේශක සේවා | **(i)** උපදේශන වාර්තාවන් **38** ක් ලබා දී තිබුණද, එම වාර්තාවන් ලැබී මාස **1** ත් **6** ත් අතර කාලයක් ගත වූ පසුවද එම වාර්තා **2021** මාර්තු මාසය දක්වාම සමාලෝචනය කර නොතිබුණි. | ව්‍යාපෘතිය අවලංගු කිරීම නිසා උපදේශන කොන්ත්‍රාත් තුනම **2020** ඔක්තෝබර් **12** දින අවසන් කරන ලදී. | ව්‍යාපෘතියෙහි වැඩකටයුතු අවසන් කිරීම තුලින් ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ශක්තිමත් හා කාර්යක්ෂම උපදේශන සේවාවන් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. |
| | | **(ii)** සමාලෝචිත වර්ෂය අවසාන වීමට පෙර ඉදිරිපත් කළ යුතුව තිබුණු උපදේශන වාර්තාවන් **30** ක්, **2021** අප්‍රේල් මාසය අවසානය දක්වාම ඉදිරිපත් කර නොතිබුණි. උපදේශන වාර්තා මාස **1** සිට **13** දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණද, කිසිදු උපදේශකවරයෙකුගෙන් ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. එසේම, ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට අදාළ ප්‍රතිපාදන කිසිවක් ගිවිසුම්වලට ඇතුලත් කරද නොතිබුණි. ප්‍රමාණවත් උපදේශක කාර්ය මණ්ඩලයක් වැඩ කටයුතු සඳහා යෙදවීමට කටයුතු නොකිරීම මෙම ප්‍රමාදයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | කොවිඩ් - **19** වසංගතය හේතුවෙන් රට වසා තැබීම නිසා ව්‍යාපෘතියෙහි සැලසුම්කර, ලබා වීමට නොහැකි විය. | ව්‍යාපෘතියෙහි වැඩකටයුතු අවසන් කිරීම තුලින් ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ශක්තිමත් හා කාර්යක්ෂම උපදේශන සේවාවන් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. |

**2.2** නිශ්කාර්ය හා ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ලැබුණු තොරතුරුවලට අනුව, ණය ලබාදීමේ නියෝජිතායතනය මඟින් ලබාදී තිබුණු රු.මිලියන 883.88 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 4.65 ක මුදලින්, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර 2020 දෙසැම්බර් 31 දිනට මාස 21 ක් ගත වූ පසුවද උපයෝජනය කර තිබුණේ එ.ජ.ඩොලර් මිලියන 1.32 කට සමාන රු.මිලියන 255.40 ක් හෙවත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 29 ක් පමණි. එසේම ව්‍යාපෘති කටයුතුවල පැවති දුර්වල ප්‍රගතිය හා ව්‍යාපෘතියෙහි දුර්වල මූල්‍ය පුරෝකතනය හේතුවෙන් රු.මිලියන 14.79 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 79,394 ක් උපයෝජනය කිරීමකින් තොරව 2020 දෙසැම්බර් 31 දිනට විශේෂ (ඩොලර්) ගිණුමේ රඳවා ගෙන තිබුණි. | ව්‍යාපෘතියේ අරමුදල් සපයා ගැනීමේ වැඩපිළිවෙලට බලපෑමක් සිදුවන අතර එය ව්‍යාපෘතියේ වැඩකටයුතුවල දුර්වල ප්‍රගතිය කෙරෙහි බලපෑමක් කළ හැකිය. | කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ව්‍යාපෘතියෙහි වැඩකටයුතු ප්‍රමාද විය. | ව්‍යාපෘතියේ වැඩකටයුතු සැලසුම් කළ කාලය තුළ හා අයවැය ලේඛනයට අනුකූලව නිම කිරීමට කටයුතු කළ යුතුය. |

**2.3** මානව සම්පත් කළමනාකරණයට අදාල නිරීක්ෂණ

---------------------------------------------------

ව්‍යාපෘතියෙහි සමස්ථ අනුමත කාර්යමණ්ඩලය 28 කින් සමන්විත වන අතර මෙයින් ප්‍රධාන කළමනාකරණ තනතුරු 8 ක් එනම් ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති කළමනාකරු, ප්‍රසම්පාදන විශේෂඥ හා ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරීන් යනාදි තනතුරු 2020 දෙසැම්බර් 31 දින දක්වාම බඳවා ගැනීමකින් තොරව පුරප්පාඩුව පැවතුණි.

| කාර්ය මණ්ඩලය | තනතුරු සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|
| | අනුමත | 2020 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු/ අතිරික්ත සේවක සංඛ්‍යාව | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශ |
| සියලුම කාර්ය මණ්ඩලය | 28 | 20 | 8 | 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියෙහි අනුමත කාර්ය මණ්ඩලය 28 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 20 ක් විය. ඒ අනුව පුරප්පාඩු සේවක සංඛ්‍යාව 8 ක් විය. මෙම තත්ත්වය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතුවලට අහිතකර ලෙස බලපා තිබුණි. | ව්‍යාපෘතියෙහි සැලසුම් කිරීමේ කාර්යයන් සඳහා අවශ්‍ය අවම කාර්ය මණ්ඩලය මූලිකව බඳවා ගැනීම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කළ අතර අනෙකුත් අනුබද්ධිත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ ප්‍රමාදයක් ඇති විය. (එනම් අනුමත කාර්ය මණ්ඩලය) මේ සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පැවති තත්ත්වය බලපාන ලදී. ඇතැම් අනුබද්ධිත කටයුතු සේවක මණ්ඩලය අතර හුවමාරු කර ගනිමින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් ඉටුකරන ලදී. | අනුමත කාර්ය මණ්ඩලය අනුව තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |